
ඔබ දන්නවාද..

# ඔබ දන්නවා

**දෙවියන්වහන්සේගේ ඇස් හමුයෙහි ඔබ පව්කරුවෙකු බව දන්නවාද?**

‘සියල්ලෝම පව්කොට දේව මහිමයෙන් හීනව සිටිති’ රෝම 3:23.

‘අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටා ගනිමුව, සැබෑවද අප තුළ නැත’ 1 යොහන් 1:8.

**ඔබට මරණය සහ දෙවියන්වහන්සේ සමඟ හමුවීමක් තිබෙනවා’**

‘තවද එක් වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක් මෙන්ම… ’ හෙබ්‍රෙව් 9:27.



**දෙවියන්වහන්සේ විසින් ඔබ විනිශ්චය කරනු ඇති?**

‘එබඳු දේ කරන්නන් විනිශ්චය කරමින් එම දේ කරන මනුෂ්‍යය, නුඹ දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන් ගැළවෙන්නෙහියයි සිතන්නෙහිද? ’ රෝම 2:3.

**ඔබ දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබගේ ජීවිතය නිවැරදිකර නොගන්නේ නම් ඔබ සදාකාලික ගිනි විලට යනු ඇත?**

‘දෙවියන්වහන්සේ සිහිනැතිකරන සියලූ ජාතීහු මෂයෝලට හැරීයන්නාහුය’ ගීතාවලිය 9:17.

‘ගිනි උදුනෙහි හෙළන්නෝය. එහිදී හැඬීමද දත්මිටිකෑමද වන්නේය’ මතෙව් 13:42.

**දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබගේ ජීවිතය නිවැරදිකරගැනීමට මාර්ගයක් ඇත.**

‘මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය’ යොහන් 3:16.

## සදාකාල ජීවනය හිමිකරගැනීම සඳහා මා කුමක් කළ යුතුද

### 1.පසුතැවිලිවීම



‘ඉතින් මේ නොදන්නාකමේ කාලවල් දෙවියන්වහන්සේ නොබලා හැරිය නුමුත් සියලු මනුෂ්‍යයන්ට හැමතැන්හි පසුතැවිලිවෙන්ට දැන් අණකරනසේක’ කියා 17:30.

### 2.ඔබගේ ගැළවුම්කරු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පිළිගන්න

‘නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම්, උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක’ යොහන් 1:12.

## 3. දෙවියන්වහන්සේට ඔබගේ පව් කියාදෙන්න

‘අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක’
1 යොහන් 1:9.

## 4. ශුභාරංචියට අනුව ජීවත්වන්න

‘නුමුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙන්න’ යාකොබ් 1:22.



‘මාගේ ආඥා පවත්වා ජීවත්වෙන්න මාගේ උපදෙස්ද නුඹේ ඇසේ කළුරුවාව මෙන් රකෂාකරන්න’ හිතෝපදේශ 7:2